# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම අංක 06 -2020
## පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්

Name / Index No :........................................................ **Grade 3**

**2020.05.18 සිට 2020.05.24 සතිය දක්වා පරිසරය වැඩ පොතේ කරවන්න.**

❖ දෙමාපියන් සඳහා උපදෙස්,

- හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා පරිසරය පොතේ අලවන්න.
- හැකි ලෙස දරුවාට පාඩමේ කොටස් පැහැදිළි කර දෙන්න.
- පිළිතුරු පමණක් දරුවාට ලියන්න දෙන්න.
- පිළිතුරු ලැබුණු පසු අකුරු නිවැරදි කරන්න.

## <u>06- ගෙවත්ත.</u>

**2020.05.18 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

14. අතු හෝ දඬු සිටුවා පැළ ලබා ගැනීම.

අවශ්‍ය දේවල්-

- සෙන්ටි මීටර 15 පමණ උස වගා කවර ( ඉටිකොළ බෑග් ) 10 ක්.
- කාබනික ( කොම්පෝස්ට් ) පොහොර, වැලි හා පස් සමාන ප්‍රමාණයන් ගෙන කවලම් කරගත් මිශ්‍රණයක්
- මේරූ කංකුං දඬු 10ක්
- ජලය

ක්‍රියාකාරකම - **වට්ස් ඇප් වීඩියෝව බලන්න**

- වගා කවර 10 ට සාදා ගත් පස් මිශ්‍රණය දමන්න.
- එම කවරවල කංකුං දණ්ඩ බැගින් සිටුවන්න.
- ප්‍රමාණවත් ලෙස ජලය දමා දින 3ක් හෝ 4ක් නොසෙල්වෙන සේ තබන්න.
- දිනපතා ජලය දමන්න.



Richmond College - Grade 3 - 2020

නිරීක්ෂණය කරන ආකාරය -

- දින 3න් 3ට එක් කංකුං දණ්ඩ බැගින් මුල් නොකැඩෙන සේ ගලවා මුල් සෑදී ඇති ප්‍රමාණය නිරීක්ෂණය කරන්න.
- ඉතිරි කංකුං දඬුවලට දිනපතා ජලය දමන්න.

දුටු දේ -

- දිනෙන් දින කංකුං දණ්ඩ පැළවෙන අතර ඒවායේ ඇති මුල් ප්‍රමාණය වැඩි වී ඇත.




දඬු පැළ කිරීම මගින් ද අපට පැළ ලබාගත හැකිය.

**2020.05.19 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

15. තවාන් මගින් පැළ ලබා ගැනීම.

වට්ස් ඇප් වීඩියෝව බලන්න

අවශ්‍ය දේවල් -

- තවාන් දැමීම සඳහා බඳුනක් හෝ කුඩා බිම් කොටසක්.
- පස්, වැලි හා කාබනික ( කොම්පෝස්ට් ) පොහොර සමාන ප්‍රමාණයන් ගෙන සාදා ගත් පස් මිශ්‍රණය.
- ඉක්මනින් පැළවෙන මිරිස් හෝ කූඩලු හෝ දාස් පෙතියා වැනි බීජ වර්ගයක්.
- ජලය.

ක්‍රියාකාරකම -

- පෝච්චියට හෝ තවාන් කරන බිමට සාදා ගත් පස් මිශ්‍රණය එක් කරන්න.
- එයට ඉහත සඳහන් කළ බීජ වර්ගයක් දමන්න. ජලය එක් කරන්න.
- දිනපතා ජලය ස්වල්පයක් බැගින් දමන්න.
- බීජවලට සිදුවන වෙනස්කම් දිනපතා නිරීක්ෂණය කරන්න.
- පැළ ප්‍රමාණවත් ලෙස වැඩුණු පසු මුල් නොකැඩෙන සේ ගලවා වගා බඳුන්වල හෝ සුදුසු ස්ථානයක සිටුවන්න.

දුටු දේ -



තවාන් මගින් ද පැළ කිරීමට අපට පැළ ලබාගත හැකිය.

Richmond College – 2020

**2020.05.20 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

16. පැළ ලබාගත හැකි ආකාර අනුව පහත වගුව පුරවන්න.

| පැළ ලබා ගැනීමට බීජ සිටුවිය හැකි බීජ | පැළ ලබා ගැනීමට සිටුවිය හැකි දඬු | පැළ ලබා ගැනීමට තවාන් දැමිය හැකි බීජ |
|---|---|---|
| මුං | කංකුං | මිරිස් |
| බෝංචි | මුකුණුවැන්නා | කුඩලු |
| මෑ | මඤ්ඤොක්කා | දාස්පෙතියා |
| බණ්ඩක්කා | බතල | වම්බටු |
| ඉරිඟු | බුලත් | රාබු |
| අඹ | ගිනිසීරියා | මාලුමිරිස් |

17. ගෙවත්තක් චිත්‍රයට නගන්න.

අභ්‍යාස පොතේ අඳින්න

**2020.05.21 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

18. ගෙවත්තක ආකෘතියක් තැනීමට පරිසරයෙන් ගත හැකි දේවල් කීපයක්.

- ලෑලි කීපයක් හෝ සෘජුෆෝම් කෑල්ලක්
- මැටි
- කුඩා කෝටු
- කුඩා පැළ, අතු වැනි දේවල්
- නූල්

19. ගෙවත්තක වටිනාකම දැක්වෙන පහත නාට්‍ය කොටසේ දෙබස් පුරුදු වන්න.

1 රෝගියා : ඇඟ කසනවා, ඇඟ කසනවා
ඉක්මනින් ම බෙහෙත් දෙන්න.

වෛද්‍යවරයා : මොනවද කෑවේ කියන්න මොනව ද කෑවේ ?

1 රෝගියා : එළවළුයි බතුයි කෑවේ
බතුයි එළවළුයි

වෛද්‍යවරයා : (ලෙඩා පරීක්ෂා කර බලා)
වල් නාශක කෘමිනාශක
එළවළුවල තියෙන්න ඇති
විෂ වීලා ඇඟ පුරා ම කසන්නට ඇති
කඩෙන් ගන්න එළවළුවල
වසවිස පිරිලා සැම විට
තියෙන ඉඩකඩේ හැටියට
වවා ගන්න එළවළු ටික

Richmond College 3 – 2020

රෝගියා : ආයේ නම් මේ වැරැද්ද
කරන්නෙ නෑ මින් මත්තට
එළවළු ටික ගෙවත්තේම
වවා ගන්නවා නිසි ලෙස

වෛද්‍යවරයා : ඊළඟ ලෙඩා කවුද එන්න

2 රෝගියා : හොඳට ම උණ හොඳට ම උණ
බෙහෙත්වලින් ගුණයක් නෑ
ලේත් බැලුවා මේ බලන්න
වාර්තාව හොඳ ද කියලා

වෛද්‍යවරයා : කෝ බලන්න කෝ බලන්න
(ලේ වාර්තාව බලයි)
ඩෙංගු වගෙයි හොඳට ම උණ
බලා නොඉඳ ඉක්මනින් ම
රෝහල වෙත රැගෙන යන්න
සැලකිල්ලක් නෑ ඒ ගැන
වටපිටාවේ පිරිසිදුකම
සොයා බලා සැම විටක ම
කටයුතු කෙරුවොත් නිසි ලෙස
ඩෙංගු නොසෑදෙයි කිසි විට
හට්ටි මුට්ටි, ටින් බෙලෙක්ක
එකතු කරලා පස් පුරවලා
මදුරුවනුත් බෝ නොවන්න
හදන්න ඔබගේ ගෙවත්ත

**2020.05.22 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

20. වගා කිරීමේ වටිනාකම දැක්වෙන පහත ගීතය පුරුදු වන්න.

මොනවද මුත්තේ මොක ද කරන්නේ
මොකට ද ඔබ ඔය බිම හාරන්නේ

ඔබටත් ළමයෝ නො පෙනෙති නො සිතමි
අඹ ඇටයක් සිටුවන්නට හාරමි

දුක සේ සිටුවා අඹ ඇටයක් අද
එක අඹයක් වත් කන්ට ලැබේවි ද

මම ළමයෝ මින් අඹයක් නො පතමි
යුතුකම පමණක් ඉටු කොට තබනෙමි

තමන්ට නොලැබෙන දෙයකින් ලෝකෙට
කරන්ට හැකි දේ නො ම තේරේ මට

Richmond College - Grade 3 – 2020

පුදුම යි ළමයෝ උඹෙ ඔය අදහස
හැදුණොත් ඔහොමට උඹට ම වෙයි දොස

පෙර උන් අය සිටවූ අඹගස්වල
පලයෙන් අපි කවුරුත් ලබනෙමු පල

අපෙන් පසු ව එන අයටත් පල එම
ලැබෙන්ට සැලසුම අපගේ යුතුකම

මේ යුතුකම හොඳ හැටි දන ගත්තෙමි
ආයුබොවන් මුත්තේ මම යන්නෙමි

පද මාලාව - ටිබෙට් එස්. මහින්ද හිමි
ගායනය : රෝහණ වීරසිංහ, අනුෂා නානායක්කාර

21. ඉහත ගීතයෙන් ගතහැකි ආදර්ශ කීපයක්.

- කම්මැලිකම් ඉවත ලා වැඩ කිරීමෙන් ලැබෙන වාසිය අපට ම අත්වන බව
- වර්තමානයේ සිදු කරන දේවලින් අත්වන යහපත් ප්‍රතිඵල අනාගතයේ දී අපට ම අත්විඳිය හැකි බව

22. පහත ක්‍රීඩාව කරන අයුරු වැඩිහිටියන් සමග සාකච්ඡා කරන්න.

- ප්ලාස්ටික් කළ කිහිපයක්/සමාන ප්‍රමාණයේ හිස් පෙට්ටි කිහිපයක් හා තරමක් විශාල බෝලයක් සපයා ගන්න. (10ක් පමණ)
- ඒවායේ එළවළු හෝ පලතුරුවල හෝ රූප එකක එක් රූපයක් බැගින් ඇඳ ගන්න. නොඑසේ නම් අලවා ගන්න.
- මෙසේ සකස් කර ගත් කල/පෙට්ටි එළිමහනේ සුදුසු ස්ථානයක වැලක් ආකාරයෙන් සිසුන්ගේ උසට සරිලන ප්‍රමාණයෙන් එල්ලන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- සිසු කණ්ඩායම් දෙක පේළි දෙකක් ආකාරයට එම කල එල්ලා ඇති ස්ථානයට තරමක් දුරින් සිටගැනීමට සලස්වන්න.
- සිසු කණ්ඩායම් දෙක A හා B වශයෙන් නම් කරන්න.
- A කණ්ඩායමේ සිටින පළමු සිසුවා B කණ්ඩායමේ සිටි පළමු සිසුවාට එල්ලා ඇති කලයක/පෙට්ටියක දක්වෙන පලතුරක හෝ එළවළුවක හෝ නම ප්‍රකාශ කළ යුතු වේ.
- ඒ අනුව B කණ්ඩායමේ පළමු සිසුවා අදාළ රූපය සහිත කලයට/පෙට්ටියට බෝලයෙන් ගැසිය යුතු ය.
- පහර නිවැරදි ව එල්ල කළහොත් B කණ්ඩායමට ලකුණක් හිමි වේ.
- පසුව B කණ්ඩායමේ පළමු සිසුවා පෙර A කණ්ඩායමේ සිසුවා ක්‍රියා කළ ආකාරයෙන් ආහාර වර්ගයක නමක් A කණ්ඩායමේ පළමු සිසුවාට ප්‍රකාශ කළ යුතු අතර ඔහු/ඇය නිවැරදි ව අදාළ කලයට/පෙට්ටියට බෝලයෙන් ගැසිය යුතු ය.
- මේ ආකාරයට කණ්ඩායම් දෙකේ ම සියලු සිසුන්ට අවස්ථාව ලැබෙන පරිදි

Richmond College - Grade 3 - 2020